සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජූලි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2021-10-24
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

## වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 “කාර්යක්ෂමතාව” යනු:

(1) යෙදවුම් සහ නිමැවුම් අතර ඇති සම්බන්ධතාවය වේ.

(2) යමක් නිවැරදිව සිදු කිරීමයි.

(3) නිවැරදි දෙය සිදුකිරීමයි.

(4) අවශ්‍ය නිමැවුම නිෂ්පාදනය කිරීමට ඇති හැකියාවයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, කළමනාකරණයේ අන්තර් පුද්ගල භූමිකාවන් අන්තර්ගතව ඇත්තේ කවර කාණ්ඩයෙහි ද?

(1) ව්‍යවසායකයා, සම්පත් බෙදාහරින්නා, කතිකා කරන්නා.

(2) නියමුවා, තොරතුරු බෙදාහරින්නා, ප්‍රකාශකයා.

(3) නාම මාත්‍ර විධායක, නායකයා, සහයෝගිතාව ගොඩනඟන්නා.

(4) නායකයා, ආරවුල් සමනය කරන්නා, නියමුවා.

1.3 පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** කළමනාකරණ ක්‍රියාවලියේදී තීරණ ගැනීම, සැලසුම් කිරීමේ අදියරට ප්‍රථමයෙන් සිදුවේ.

**(b)** ධූරාවලියේ සියලුම මට්ටම්වල සිටින සියලුම කළමනාකරුවන් තමන්ට පවරා ඇති වගකීම් සම්බන්ධයෙන් තීරණ ගැනීම අවශ්‍ය වේ.

**(c)** කළමනාකරණ ක්‍රියාවලියේ අනෙකුත් කාර්යයන් වන සංවිධානකරණය, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය යන ඒවා ක්‍රියාත්මක කිරීමේදී තීරණ ගැනීම වැදගත් වේ.

ඉහත ඒවා අතුරෙන්, තීරණ ගැනීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(b)** පමණි. (2) **(c)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

1.4 වැඩෙහි මානව මානයන් (human dimensions of work) පිළිබඳ ආවරණය කරනු ලබන කළමනාකරණ න්‍යායයන් වන්නේ:

(1) නිලතන්ත්‍රවාදී න්‍යායයන්. (2) චර්යාත්මක න්‍යායයන්.

(3) ගුණාත්මක න්‍යායයන්. (4) විද්‍යාත්මක කළමනාකාරිත්ව න්‍යායයන්.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) කාර්යසාධන ඇගයීම. (2) විනය කළමනාකරණය.

(3) ක්‍රියාවලි සැලසුම. (4) බඳවාගැනීම සහ අනුස්ථාපනය.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.6 …………………… *(සැලසුම්කරණය / සංවිධානකරණය)* යන කාර්යය අරඹන වන්නේ වැඩ ඉතා කුඩා ඒකකවලට බෙදා වෙන් කිරීමෙන්ය.

1.7 …………………… *(දිළිඳු / සේවා)* ආර්ථිකයන්ට විතැන් වීම, නූතන ව්‍යාපාර ලෝකය තුළ කළමනාකරුවන් මුහුණ දෙනු ලබන වැදගත් අභියෝගයකි.

1.8 …………………… *(ද්විත්ව සාධක න්‍යාය / අවශ්‍යතා ධූරාවලි න්‍යාය)* මගින් මිනිස් අවශ්‍යතා සහ අභිප්‍රේරණය අතර සම්බන්ධතාවය විස්තර කරනු ලැබේ.

1.9 …………………… *(නිෂ්පාදිත සංකල්පය / නිෂ්පාදන සංකල්පය)* මගින් ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන මගින් වැඩි ලාභයක් ලබාගැනීම පිළිබඳව සලකා බලයි.

1.10 සංවිධානයේ දැනට පවතින තත්ත්වයන්වලට බාහිරව ඇතිවන විශාල, ආක්‍රමණික වෙනසක් ලෙස …………………… *(පරිවර්තනීය වෙනස / උපායමාර්ගික වෙනස)* නිර්වචනය කිරීමට පුළුවනි.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 මැක්ස් වෙබර් (Max Weber) ට අනුව නිලතන්ත්‍රවාදයේ ඇති ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.12 සැලසුම්කරණයේ මූලධර්ම දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.13 සන්නිවේදනයට ඇති බාධා දෙකක්(02) සඳහන් කරන්න.

1.14 කළමනාකරුවෙක් සහ නායකයෙක් අතර ඇති වෙනස්කම් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.15 "වෙනස කළමනාකරණය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

සංවිධානයක ව්‍යුහය එහි අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙහෙයුම් සිදුවිය යුතු ආකාරය පිළිබඳව විස්තර කරයි. එමගින් ව්‍යාපාරයට තම ව්‍යාපාර මෙහෙයුම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ පාලනය කිරීම සඳහා උපකාරී වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී තොරතුරු ගලායන ආකාරය ද එමගින් නිර්වචනය කෙරේ. සංවිධානමය ව්‍යුහයක් තුළ කළමනාකරුවන් විසින් අධිකාරිය සහ වගකීම් පැවරිය යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අධිකාරිත්වය සහ වගකීම අතර ඇති වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සංවිධානකරණ ක්‍රියාවලියේ ඇතුළත් ප්‍රධාන පියවරයන් (steps) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) කළමණාකරුවෙකුට තීරණ ගැනීම වැදගත් වන්නේ ඇයිද යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

කොවිඩ්-19 (COVID-19) වසංගතය ගෝලීය ආර්ථිකයට සහ ව්‍යාපාරික කටයුතුවලට දැඩි බලපෑමක් සිදුකොට ඇති අතර, නව සාමාන්‍යකරණ තත්ත්වය යටතේ සේවකයන්ට නිවසේ සිට වැඩ කිරීමට [Work From Home (WFH)] පෙළඹවීමක් ඇතිකර තිබේ. සමහර අවස්ථාවන්හිදී සේවකයන් මෙම නව අභියෝගවලට අනුකූලවීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙම නව අභියෝගතා හේතුකොටගෙන සංවිධානයක මානව සම්පත් කළමනාකරණ කාර්යයන්ට වැඩි ප්‍රමුඛතාවයක් හිමිවී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මානව සම්පත් [Human Resource (HR)] ගිහය සඳහා අනුගමනය කළ හැකි උපායමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) කොවිඩ්-19 (COVID-19) වසංගත කාලය තුළ, සංවිධානයකට එහි අරමුණු ඉටුකර ගැනීමේදී මානව සම්පත් කළමනාකරණ [Human Resource Management (HRM)] කාර්යයන් උපකාරී වන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) සංවිධානයකට වෙනසට ඇති ප්‍රතිරෝධයන් මැඩ පැවැත්විය හැකි ආකාර (ways) දෙකක්(02) **හඳුනා දක්වන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

උපායමාර්ගයක් මගින් සංවිධානයකට තම අනාගතය හැඩගස්වා ගැනීමේදී ප්‍රතික්‍රියාශීලීවීමට වඩා ක්‍රියාශීලීවීමට යොමු කරනු ලබයි. අනාගතයේදී තම ව්‍යාපාර වඩාත් සුරක්ෂිත කිරීම සඳහා සංවිධාන විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබන අතර, සංවිධානයේ ආයු කාලය තුළ එහි දැක්ම මුදුන්පත් කර ගනිමින් අභ්‍යන්තර පරිසරය, බාහිර පරිසරය සමඟ සමපාත වන ලෙස සංවිධානයට මඟ පෙන්වීම, උපාය මාර්ග මගින් සිදුකරනු ලබයි. ආයතනයේ මෙහෙයුම් සඵලදායී සහ කාර්යක්ෂම ලෙස සිදුකිරීම සඳහා සැලසුම්කරණය සහ පාලනය ඉතා වැදගත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධාන තුළ ඇති විවිධ උපායමාර්ග වර්ග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) පිරිවැය නායකත්වය (cost leadership) සහ විවිධාංගිකරණය (differentiation) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) පාලනයේ ඇති සීමා දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

නිෂ්පාදනයේදී සහ සේවාවන් සැපයීමේදී, සංවිධානයක එහි සැලසුම්කරණය, සංවිධානකරණය සහ අධීක්ෂණය යන කටයුතු සඳහා මෙහෙයුම් කළමනාකරණය, ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. සංවිධානයකට ළඟාකරගත හැකි උපරිම කාර්යක්ෂමතා මට්ටම ඇතිකර ගැනීම එහි අරමුණ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පෝටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) සහායක ක්‍රියාකාරකම් (support activities) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) ව්‍යාපාර සංවිධානයක සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ භූමිකාවන් (roles) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ප්‍රධාන නිෂ්පාදන ක්‍රම දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

සංවිධානයන් විසින් පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමට මෙන්ම පාරිභෝගිකයන්ට තොරතුරු ලබාදීම සඳහා අලෙවිකරණය මෙවලමක් ලෙස භාවිත කරයි. වර්තමාන වෙළෙඳපොළ තුළ පවතින දැඩි තරඟකාරීත්වය හේතුකොටගෙන ව්‍යාපාර සංවිධාන පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට භාවිත කරන ක්‍රමයන් සමහර අවස්ථාවන්වල, සදාචාරාත්මක නොවිය හැකිය. තවද, ආයතනවලට කොවිඩ්-19 (COVID-19) වසංගතය සමඟ විවිධ වූ අලෙවිකරණ උපායමාර්ග භාවිත කිරීමට සිදුවේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සදාචාර විරෝධී (unethical) වෙළෙඳ දැන්වීම්කරණයන් (ප්‍රචාරණයන්) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) අලෙවිකරණයේදී ආචාරධර්ම වැදගත් වන්නේ ඇයිද යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) කොවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන්, ආයතනයක අලෙවිකරණ කාර්යයට / ශ්‍රිතයට (marketing function) වන බලපෑම් (impacts) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත GAG සමාගම,** ශ්‍රී ලංකාවේ බීම නිෂ්පාදන කර්මාන්තයේ දැවැන්තයෙකි. සමාගමේ ඉතා ශක්තිමත් මධ්‍යගත "පර්යේෂණ හා සංවර්ධන" දෙපාර්තමේන්තුවක් ඇති අතර, එමගින් සමාගමේ සාර්ථකත්වයට ඉතා විශාල දායකත්වයක් ලබාදේ. මිනිසුන් සෞඛ්‍යමය හේතු මත කෘත්‍රිම සිසිල් බීම පානය කිරීමට වඩා පළතුරු බීම පානයට වැඩි කැමැත්තක් දක්වන බව එමගින් මෑතකදී සොයාගෙන ඇත. ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් පසු ඉලක්කගත වෙළෙඳපොළ සඳහා පළතුරු යුෂ නිෂ්පාදනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි. "නෙක්ටාර්ස්" (Nectarzz) යනු **සීමාසහිත GAG සමාගමේ** නව පළතුරු යුෂ සඳහා වූ සන්නම් නාමය වේ. 2021 පෙබරවාරි මාසය තුළදී අඹ, දොඩම්, ඇපල් සහ මිශ්‍ර පළතුරු යන විවිධ රස වර්ග හතරකින් යුත් "නෙක්ටාර්ස්" දේශීය වෙළෙඳපොළට හඳුන්වාදෙන ලදි. දුර අවම කිරීම සඳහා, ගොවිපොළ (ගොවීන් 1,000) සහ කර්මාන්ත ශාලාව (සේවකයන් 2500) එකම භූගෝලීය ප්‍රදේශයක පිහිටුවා ඇත.

මෙම නිෂ්පාදන මිලි ලීටර 120 පැකට් සහ මිලි ලීටර 500 බෝතල්වලින් ඉදිරිපත් කර ඇති අතර, වෙළෙඳපොළ ග්‍රහණය කර ගැනීම සඳහා බෝතල් ආකර්ශනීය ලෙස සැලසුම් කර ඇත. මෙම නිෂ්පාදිත රටපුරා බෙදාහැරීම භාරව කටයුතු කරනු ලබන්නේ **සීමාසහිත GAG සමාගමේ** සැපයුම් දෙපාර්තමේන්තුව මගිනි. පාරිභෝගිකයන්ට මෙම නිෂ්පාදිතය ඕනෑම අලෙවි ස්ථානයකින් සාධාරණ මිලකට මිලදී ගත හැකිය. තොග වශයෙන් මිලදී ගැනීමේදී ආකර්ශනීය වට්ටම් හිමි වේ. අලෙවිකරණ වැඩ පිළිවෙල මගින් නව නිෂ්පාදිතය පිළිබඳව සාර්ථකව සන්නිවේදනයන් සිදුකර තිබේ. රටෙහි සෞඛ්‍ය පිළිබඳව වඩාත් සැලකිලිමත් වන පාරිභෝගිකයන් **සීමාසහිත GAG සමාගම,** ප්‍රධාන වශයෙන් ඉලක්ක කර තිබේ. පාරිභෝගිකයන්ට **සීමාසහිත GAG සමාගමේ** නිෂ්පාදිත සම්බන්ධව ඇති සැක සංකා පිළිබඳ පැහැදිලි කර ගැනීමට එහි පෝෂණවේදියාව සම්බන්ධ කර ගැනීමට අවස්ථාව සලසා දී ඇත. තවද, අවසර ලබාගත් පාරිභෝගිකයන්ට කර්මාන්ත ශාලාව නිරීක්ෂණයට ද පහසුකම් ලබා දී ඇති අතර, සමාගම සිය සේවකයන් සඳහා අඛණ්ඩ වැඩමුළු සහ පුහුණු වැඩ සටහන් ද සංවිධානය කොට ඇත. කෙසේවුවද, කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය හේතුවෙන් සමාගම සියලු ක්ෂේත්‍ර සංචාර සීමාකොට ඇති නමුත් කළමනාකාරීත්වය විසින් සිය ගනුදෙනුකරුවන් සමග අන්දැකීම් හුවමාරු කර ගැනීමට විකල්ප ක්‍රම අධ්‍යයනය කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආයතනික සාර්ථකත්වය සහතික කර ගැනීම සඳහා **සීමාසහිත GAG සමාගමේ** නායකත්ව භූමිකාව වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු හතරක්(04) **පැහැදිලි කරන්න.** (ලකුණු 08)

(b) කොවිඩ්-19 (COVID-19) වසංගතය තුළ, **සීමාසහිත GAG සමාගමේ** සේවකයන් අභිප්‍රේරණයේ (motivation) වැදගත්කම් තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) මෙම වසංගත තත්ත්වය තුළ "නෙක්ටාර්ස්" නිෂ්පාදිත සඳහා **සීමාසහිත GAG සමාගම** විසින් භාවිත කළ හැකි ප්‍රවර්ධන ක්‍රම හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) මානව සම්පත් කළමනාකරණ කාර්යයක් ලෙස සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂිත කළමනාකරණයෙන් **සීමාසහිත GAG සමාගමට** ඇති ප්‍රතිලාභ හතරක්(04) **සඳහන් කරන්න** (ලකුණු 04)

(e) **සීමාසහිත GAG සමාගමට** උපායමාර්ගික සැලසුම්කරණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **සඳහන් කරන්න** (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුමමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |